## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ ආඥා පනතේ (283 අධිකාරය) සහ 1983 අංක 18 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගම් පනතේ 18 (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාමාජිකයා මිය යාම හෝ වෙනත් හේතු මත අය වීම හිඟ හිට ඇති, ණය ගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්වන රු.1,060,279 ක ශේෂය හා සාමාජික ණය ගිණුම් 348 ක් තුල පවතින තවදුරටත් එසේ හිඟ හිට ඇති රු.14,040,217 ක ණය ශේෂය ද ඇතුළත් එකතුව රු.15,100,496 ක ණය ශේෂ වසරකට වැඩි කාලයක සිට නිරවුල් වී නොතිබුණි. එම ශේෂ අතරින් රු.892,064 ක් වසර පහකට වඩා වැඩි කාලයක සිට නිරවුල් වී නොතිබුණ බව නිරීක්ෂණය විය. තවද, මරණ පාරිතෝෂිකය ගෙවා ඇති සාමාජිකයින් 18 දෙනෙකුගෙන් පමණක් තවදුරටත් අය විය යුතු ණය ශේෂය රු.1,888,461 ක් බව නියැදි විගණන පරික්ෂාවේ දී අනාවරණය විය. | සාමාජිකයින් 348 අතරින් 41 ක් විදේශ දූතමණ්ඩල සේවයේ යෙදී ඇති බැවින් වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව මුදල් අය වන බව සහ ලිපි හා දුරකථන මඟින් සාමාජිකයන් මෙන්ම අදාළ දෙපාර්තමේන්තු දැනුවත් කර අනෙකුත් හිඟ ශේෂ අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට විධිමත් පියවර ගත යුතු වීම. |
| (ආ) | සංගමය විසින් 2013 වර්ෂයේ දී බිම් මහලේ පරිශ්‍රයෙන් කොටසක් බාහිර ආයතනයකට කුලියට ලබා දී තිබුණු අතර එම ආයතනය සංගමයේ ගොඩනැගිල්ලෙන් ඉවත් වී වසර 5 කුත් මාස 03 ක් ගත වී තිබුණ ද හිඟ කුලිය වන රු.127,000 ක මුදල අය වී නොතිබුණි. | අය කර ගැනීම සඳහා සිදු කළ ලිඛිත දැනුම් දීම් සඳහා ප්‍රතිචාර නොදැක්වීම මත 2016 නොවැම්බර් 12 දින අදාළ ආයතනය සමථ මූල මණ්ඩලයට කැඳවූ බව සහ එහි දී ආයතනයේ සභාපතිවරයා විසින් හිඟ මුදල් ගෙවීමට එකඟ වූ වුවත් මේ දක්වා ගෙවා නොමැති බව | හිඟ කුලිය අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සාමාජිකත්වය අහෝසි වී ඇති සාමාජිකයන්ගේ දායක මුදල් ගිණුමේ නිරවුල් කර නොතිබුණ රු.15,629,037 ක බැර ශේෂය විධිමත් පරිදි හඳුනා ගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. ඉකුත් වර්ෂයේ මෙම ශේෂය රු.12,062,928 ක් වූයෙන් නිරවුල් නොවූ ශේෂය වාර්ෂිකව ඉහළ යමින් පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | සාමාජිකයන් තම මුදල් ලබා ගැනීමට ඉදිරිපත් නොවීම සහ ලිපි ලේඛණවල පවතින අඩු පාඩු හේතුවෙන් මෙම ශේෂ ඉතිරි වී ඇති බව සහ හිමිකරුවන් ඉදිරිපත් වූ පසු නියමිත ක්‍රමවේදය අනුව ගෙවීම් සිදු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට විධිමත් පියවර ගත යුතු වීම. |

## 1.6 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1891 අංක 05 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් ව්‍යවස්ථාවේ 16 (I), (2) සහ (3) වගන්ති | සංගමයේ 133 සහ 134 මහ සභා රැස්වීම්වල දී අනුමත වූ රීති සංශෝධන ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. | ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | නීති,රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාවේ I පරිච්ඡේදයේ 10 (1) වගන්තිය | සාමාජිකයෙකුගේ මරණය දැනුම්දී මාස දෙකක් ඇතුලත ඔහුට හිමි ප්‍රදානය ගෙවිය යුතු වුවත්, මිය ගිය සාමාජිකයන් වෙනුවෙන් එසේ ගෙවිය යුතු රු.4,925,000 ක මරණ ප්‍රදාන මුදල් 2018 දෙසැම්බර් 31 දින දක්වාත් ගෙවා නොතිබුණි. | අවශ්‍ය ලිපි ලෙඛණ හා සහතික නිසි පරිදි ඉදිරිපත් නොවීමත් මුදල් ගෙවීමට අදාළව යවනු ලබන කුවිතාන්සි ආපසු නොලැබීමත් වැනි හේතු ගෙවීම් ප්‍රමාද වීමට බලපා ඇති බව. | |
| (ඇ) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාවේ I පරිච්ඡේදයේ 7 (ආ) (i) වගන්තිය | ණය වාරික 6 කට වඩා හිඟ හිටි සාමාජිකයන් 20 දෙනෙකු වෙනුවෙන් ව්‍යවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ අතර සමාලෝචිත වර්ෂය අවසන් දිනට එම සාමාජිකයින්ගෙන් අය විය යුතු ණය ශේෂයේ එකතුව රු.330,032 ක් විය. | සාමාජිකයින් 20 අතරින් එක් සාමාජිකයෙකු ගෙවීම් සිදු කර ඇති අතර ඉතිරි සාමාජිකයින් සඳහා සාමාජික අවසන් ගිණුම් සකස් කර ඉදිරි කටයුතු කිරීමට නියමිත බව. | |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 මුදල් රෙගුලාසිය | නියමිත පරිදි 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම | වාර්තා සකස් කරමින් පවතින බව. | |

| | | | | |
|---|---|---|---|---|
| | | වාර්තාව 2019 මැයි 06 දින වන විට ද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | | නීති,රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | 2003ජුනි 02 දිනැති PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය | ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව. | |
| (ඊ) | 2014 පෙබරවාරි 14 දිනැති 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | | |
| (උ) | 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11.2 සහ 11.6 වගන්ති | තිරසාර සංවර්ධන අරමුණු ලගාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙය විය යුතු වන නමුත් මේ දක්වා සංගමය විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | | |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.56,626,660 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.51,606,969 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,019,691 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, ණය ලබා දීම මත ලැබී ඇති පොලී ආදායම රු.7,557,726 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| සංගමය විසින් පවත්වනු ලබන මාසික පාලන කමිටු රැස්වීම් සහ විශේෂ පාලන කමිටු රැස්වීම් සඳහා මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් සාමාජිකයින් දෙදෙනෙකු නම් කර තිබුණ ද අදාළ රැස්වීම් සඳහා ඔවුන්ගේ සහභාගීත්වය දුර්වල මට්ටමක පැවතුණි. ඒ අනුව, 2018 වර්ෂයේ දී පවත්වා තිබුණු රැස්වීම් වාර 20 අතරින් එක් නියෝජිතයෙකු රැස්වීම් වාර 7 කට සහභාගී වී නොතිබුණි. අනෙක් නියෝජිතයා පත්වීමේ දින සිට රැස්වීම් වාර 13 කට සහභාගී විය යුතුව පැවතියද සහභාගී වී තිබුණේ රැස්වීම් 5 කට පමණි. | දැනුම්දීම් සිදු කළ ද නිලධාරීන්ගේ අධික කාර්ය බහුලතාවය හේතුවෙන් සහභාගී නොවන අවස්ථා පවතින බව. | කමිටු රැස්වීම් සඳහා සහභාගී විය යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සාමාජිකයාගේ මූලික වැටුපෙන් සාමාජිකයා එකඟ වූ ප්‍රතිශතයක් සාමාජික දායක මුදල් ලෙස සංගමය විසින් මාසිකව අය කරනු ලබයි. එහෙත් සාමාජිකයාගේ මූලික වැටුප වාර්ෂිකව වැඩි වී තිබුණ ද වැඩි වූ මූලික වැටුපට අනුරූපව සාමාජිකයින්ගෙන් සාමාජික දායක මුදල් අය කර ගෙන නොතිබුණ අවස්ථා 35 ක් නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | ඉල්ලීම් සිදු කළ ද ආයතන ප්‍රධානීන් විසින් වර්තමන වැටුප දන්වා නොමැති අවස්ථා පවතින අතර ණය ඉල්ලුම් කිරීමේ දී වැටුප් පත් ඉදිරිපත් කරන අතර ඒ අනුව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | සාමාජික දායක මුදල් අය කිරීම විධිමත් කළ යුතු වීම. |
| (ආ) සංගමය විසින් ලබා දී ඇති දේපළ ණය සම්බන්ධයෙන් පරිගණක පද්ධතිය ඇසුරින් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.995,098 ක දේපළ ණය ශේෂයක් පවතින සාමාජිකයන් 4 දෙනෙකු විසින් එම ණය ගෙවීම් පැහැර හැර ඇති බවයි. | එක් නිලධාරියෙකු ණය පියවා ඇති අතර ඉතිරි තිදෙනාගෙන් ණය අය කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික ලේඛණ සැකසෙමින් පවතින බව. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා විධිමත් පියවර ගත යුතු වීම. |
| (ඇ) සාමාජිකයා මිය යාම හෝ වෙනත් හේතු මත 2014 දෙසැම්බර් 31 දක්වා අය වීම හිඟ හිට ඇති ණය ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැතියන් ලෙස වාර්තා කර තිබුණි. කෙසේ වුවද එතෙක් පැවති ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2015 වර්ෂයේ සිට වෙනස් කර එවැනි හිඟ ණය ශේෂ සාමාජික ණය ශේෂ ගිණුම තුලම වාර්තා කිරීමට සංගමය විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුල ණයගැති ශේෂය අනාවරණය කිරීම නිවැරදිව සිදු කර නොතිබුණි. | ප්‍රතිපත්තිමය වෙනස මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් පිළිබඳ ප්‍රතිපත්තිය යටතේ දක්වා ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අනාවරණයන් සිදුවන පරිදි යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු වීම. |
| (ඈ) ඉකුත් වර්ෂ 5 තුල සංගමයේ සංවත්සර සභා රැස්වීමවලට සාමාජිකයින්ගේ සහභාගීත්වය මුලු සාමාජිකත්වයෙන් ආසන්න වශයෙන් සියයට 11 ත් 13 ත් අතර විය. මේ හේතුවෙන් සංගමයේ පාලක සභාවට සුදුසු සාමාජිකයින් තෝරා ගැනීම මෙන්ම සංගමයේ අභිවෘද්ධිය සඳහා තීරණ ගැනීම අඩු සාමාජික නියෝජනයකින් සිදු වී ඇති බව විගණනයේ දි නිරීක්ෂණය විය. | සියළු සාමාජිකයන්ට පෞද්ගලික වන සේ සංගමයේ වාර්තාව සමඟ සභාව පවත්වන දිනය දන්වා යැවීමත්, පුවත් පත් දැන්වීමක් මඟින් ද දැනුවත් කරන බව. | සංවත්සර සභා රැස්වීම සඳහා සාමාජික සහභාගිත්වය වැඩි කරවා ගැනීම සඳහා පියවර ගත යුතු වීම. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කර ශුද්ධ ප්‍රතිඵලය මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී හඳුනා නොගත් ප්‍රේෂණ ගිණුමේ ලැබීම් හා ගෙවීම් ශේෂ ගලපා ශුද්ධ ශේෂය ලෙස රු.1,959,112 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හිමිකරුවන් ඉදිරිපත් වූ වහාම එම මුදල් නිරවුල් කිරීමට සංගමය බැඳී සිටින බැවින් වත්කම් ලෙස ප්‍රකාශ කර නොමැති බව සහ මෙම ගිණුම සංගමයට වගකීමක් බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට සංගමය වෙත ලැබී තිබුණු විවිධ ආදායම් හා වෙනත් ලැබීම්වල එකතුව රු.1,959,112 ක් විධිමත් පරිදි හඳුනා ගෙන ගිණුම් ගත කිරීම වෙනුවට ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම ශේෂය වාර්ෂිකව වර්ධනය වෙමින් පවතින අතර ඉකුත් වර්ෂයේ එම ශේෂය රු.1,660,266 ක් බව නිරීක්ෂණය විය. | බැංකු ගිණුම හරහා සෘජුවම සංගමයට ලැබී ඇති හිමිකරුවෙකු හෝ දෙපාර්තමේන්තුවක් හඳුනා ගත නොහැකි මෙම මුදලට අදාළ හිමිකරුවන් හඳුනා ගැනීමට කටයුතු කරන බව. | විවිධ ආදායම් හා ලැබීම් විධිමත් පරිදි හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු වීම. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වාර්ෂික ප්‍රසම්පාදන සැලසුමේ ඇතුළත් එකතුව රු.2,175,000 ක්වූ අයිතම 6 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කර නොතිබුණ අතර ප්‍රසම්පාදන සැලසුමේ නොමැති එකතුව රු.1,745,743 ක් වටිනා අයිතම 4 ක් සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන කර තිබුණි. ඒ අනුව, සංගමය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන සැලසුමට අනුව සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | ආයතනයේ අවශ්‍යතා සපුරා ගැනීමට කළමනාකරණ කමිටුව තීරණය කළ බැවින් සැලසුමට ඇතුළත් අයිතම ප්‍රසම්පාදනය කර නොතිබීම හා සැලසුමේ ඇතුළත් නොවූ අයිතම ප්‍රසම්පාදනය කිරීමට සිදු වී ඇති බව. | විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලසුම් සකසා ඒ අනුව, ප්‍රසම්පාදන කළ යුතු බව හා ප්‍රසම්පාදන සැලසුම් කාලීනව අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට පියවර ගත යුතු බව. |
| (ආ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගම් ගොඩනැගිල්ලේ බිම් මහල අලුත්වැඩියා කිරීම රු.1,475,065 ක ගිවිසුම් ගත මුදලකට කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. පිළියෙල කර තිබුණු ලංසු ලියවිලි සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව, තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය හා | BOQ හි ඇතුළත් නොවූ තීන්ත ආලේප කිරීම සඳහා රු.226,928 ක මුදල ගෙවා ඇති බව හා කෙටි කාලීන කොන්ත්‍රාත්තුවක් බැවින් ප්‍රමාද ගාස්තු අය නොකිරීමට තීරණය කළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු බව. |

ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගෙන තිබුණ බව ලිපි ගොනුව අනුව තහවුරු නොවුණි. ගිවිසුම් ගත කාර්යයන් හා අමතර වැඩ වෙනුවෙන් ගිවිසුම් ගත මුදලට වඩා වැඩියෙන් එකතුව රු.226,928 ක මුදලක් ගෙවා තිබුණ ද ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවෙන් ලබා ගත් අනුමැතිය ලිපි ගොනුව පරික්ෂාවේ දී නිරීක්ෂණය නොවීය.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---

### 4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෙජර ගිණුම්වල ශේෂයන්ට සමාලෝචිත වර්ෂයට අදාළ ගැලපීම් ජ'නල් සටහන් මඟින් සිදු කිරීමට පරිගණක පද්ධතියේ පහසුකම් සපයා නොතිබුණි. පරිගණක පද්ධතියෙන් ලබා ගන්නා ශේෂයන්ට පද්ධතියට පරිබාහිරව ජ'නල් සටහන් මඟින් ගැලපීම් සිදු කර එම ශේෂ පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. ඒ අනුව, පරිගණක පද්ධතිය ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ගැනීමේ පහසුකම, පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය තුල නොමැති බව නිරීක්ෂණය විය. එම නිසා පරිගණක පද්ධතියට පරිබාහිරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඩු පාඩු පැවතීමේ අවදානමක් පවතින බව අවධාරණය කෙරේ. | පරිගණක පද්ධතිය තුල මෙම ගැටළුව පවතින බවත් 2019 වර්ෂයේ දී අඩු පාඩු සකස් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සකස් කළ හැකි වන පරිදි පරිගණක පද්ධතිය වැඩි දියුණු කර ගත යුතු බව. |